# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 42 — 1973 ජනවාරි 12 වැනි සිකුරාද — 1973.01.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 39 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 46 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 45 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 46 |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ඒවා නිපදවන්නන් සහ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 3. 14 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත්‍රය සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

යොමුව : 3/1-(4/26)

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973.1.1.

1–340—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

මට්ටක්කුලිය, තුඹ්ගිරිය සහ වේයන්ගොඩ ගබඩාවල සිට බලවේග ව්‍යාපාරයන් කරා නූල් සහ රෙදි පිළි ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 1. 31 දින පෙ. ව. 10. දක්වා භාරගනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත්‍රය සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂගෙන් විමසන්න.

යොමු අංකය : 3/1 (5/44)

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973.1.1

1–339—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

## ටෙන්ඩර් දැන්වීම්

වයඹ දිසාවේ කුලියාපිටිය කොට්ඨාශයේ (1973) මුදල් වර්‍ෂය තුළ ද්‍රව්‍ය සේවයන් හා ප්‍රවාහණය සැපයීම් සඳහා වූ ටෙන්ඩර් පත්‍ර කැඳවීමේ විස්තර.

1973 මුදල් වර්‍ෂය තුළ පහත සඳහන් වැඩ ඩිපෝවලට ද්‍රව්‍ය, සේවාවන් හා ප්‍රවාහණය සැපයීම වෙනුවෙන් 1973 ජනවාරි 30 වෙනි අඟහරුවාදා පෙ. ව. 10.00 වන තෙක් වයඹ දිසාවේ වැඩ අධ්‍යක්ෂ විසින් භාරගන්නා ටෙන්ඩර් පත්‍ර එම අවස්ථාවේදී විවෘත කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තුවක රු. 15,000 ක් හෝ ඊට වැඩි ගණනක් ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුසුසන් වේ.

කොට්ඨාශයේ නම : කුලියාපිටිය

වැඩ ඩිපෝවල නම් :

1. හොරොම්බාව
2. නක්කාවත්ත
3. අස්වැද්දුම
4. කරගහගෙදර
5. කතුල්ල
6. උඩුබද්දාව

ද්‍රව්‍ය.

1. ඉරූ දෙකේ පොල් අතු (අඩි 7ක් දිග හා අඟල් 18 ක් පළල 1000 ක මිළ)
2. පිලිස්සූ හුණු (රු. 44 ට නොඅඩු බර ඇති බුසලක මිළ)
3. කලු ගල් 6″×9″ (කියුබයකට) මැනීමට ගොඩගැසූ
4. කලු ගල් ½″ (කියුබයකට) මැනීමට ගොඩගැසූ
5. කලුගල් ¾″ (කියුබයකට) මැනීමට ගොඩගැසූ
6. කලුගල් 1″ (කියුබයකට) මැනීමට ගොඩගැසූ
7. කලුගල් 1½″ (කියුබයකට) මැනීමට ගොඩගැසූ
8. කලුගල් 2″ (කියුබයකට) මැනීමට ගොඩගැසූ
9. ගඟේ වැලි (කියුබයකට) මැනීමට ගොඩගැසූ
10. බොරළු (කියුබයකට) මැනීමට ගොඩගැසූ
11. පිලිස්සූ ගඩොල් (1000 කට)
12. ගෝනි 100 කට
13. දර (සත යාරයකට)

සේවාවන් :

14. බර කරත්ත කුලියට දීම (පැය 8 ක් වැඩ කරන දිනකට)
15. බර බාග කරත්ත කුලියට දීම (පැය 8 ක් වැඩ කරන දිනකට)
16. අලියෙකු කුලියට දීමට (දිනකට)
17. කෘෂිකාර්මික ට්‍රැක්ටර් ට්‍රේලර යෙදීම (දිනකට)
18. විවෘත ටොන් 3තේ ලොරි කුලියට දීම (වැඩ කරන පැය 8 ක් දිනකට)
19. විවෘත ටොන් 5හේ ලොරි කුලියට දීම (පැය 8 ක් වැඩ කරන දිනකට)
20. ටොන් 3 ටිපර් රථ කුලියට දීම (පැය 8 ක් වැඩ කරන දිනකට)

ප්‍රවාහණය :

21. කලුගල්, කැටගල්, වැලි හා බොරළු ප්‍රවාහණය
    (අ) තාර පාරවල කියුබයක් සැතපුමක් ප්‍රවාහනයට
    (ආ) බොරළු පාරවල කියුබයක් සැතපුමක් ප්‍රවාහණයට
    (ඇ) පස් පාරවල කියුබයක් සැතපුමක් ප්‍රවාහණයට
22. පොල් අතු හා ගඩොල් ප්‍රවාහණය කිරීම
    (අ) තාර පාරවල සැතපුමක් (1000 ක්) ප්‍රවාහණය කිරීමට
    (ආ) බොරළු පාරවල 1000 ක් සැතපුමක් ප්‍රවාහණය කිරීමට
    (ඇ) පස් පාරවල 1000 ක් සැතපුමක් ප්‍රවාහණය කිරීමට
23. අඩි 4 ක් විශ්කම්භය ඇති අඩි 8 ක් දිග කොන්ක්‍රීට් පයිප්ප ප්‍රවාහණය
    (අ) තාර පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
    (ආ) පස් පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
    (ඇ) බොරළු පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
24. අඩි 3 ක් විශ්කම්භය ඇති අඩි 8 ක් දිග කොන්ක්‍රීට් පයිප්ප ප්‍රවාහණය කිරීම
    (අ) තාර පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
    (ආ) බොරළු පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
    (ඇ) පස් පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
25. අඩි 2ක් විශ්කම්භය ඇති අඩි 8 ක් දිග කොන්ක්‍රීට් පයිප්ප ප්‍රවාහණය කිරීම
    (අ) තාර පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
    (ආ) බොරළු පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
    (ඇ) පස් පාරවල එක පයිප්පයක් ප්‍රවාහණය කිරීමට
26. ස්ථූල ද්‍රව්‍ය ප්‍රවාහණය
    (අ) තාර පාරවල සැතපුමක් හොණ්ඩරයක් ප්‍රවාහණය කිරීමට
    (ආ) බොරළු පාරවල සැතපුමක් හොණ්ඩරයක් ප්‍රවාහණය කිරීමට
    (ඇ) පස් පාරවල සැතපුමක් හොණ්ඩරයක් ප්‍රවාහණය කිරීමට

3. 1973 ජනවාරි 27 වෙනි දිනට පෙර කාර්‍යාල වේලාවන් තුලදී, මෙම කාර්‍යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ෆෝරමවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් ෆෝරම ඉදිරිපත් කිරීමට පෙර ඕනෑම කච්චේරියක හෝ විධායක ඉංජිනේරු කාර්‍යාලයේ ටෙන්ඩර් තැන්පත් වශයෙන් රු. 25 ක් තැන්පත් කර එම කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල වයඹ පළාතේ වැඩ අධ්‍යක්ෂ තැන වෙත අනු පිටපතකින් යුතුව සීල් තබා ලියා පදිංචි තැපෑලෙන් හෝ වැඩ අධ්‍යක්ෂ කාර්‍යාලයේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියේ බහාලිය යුතුය.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ, ටෙන්ඩර්කරුවන්ට පුද්ගලිකව පැමිණ සිටිය හැකිය.

7. යම් කිසි ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුරුණෑගල වයඹ පළාතේ වැඩ අධ්‍යක්ෂ තැන සතු වේ.

8. මේ පිළිබඳ වැඩිදුර විස්තර කාර්‍යාලීය වේලාවන් තුළදී, කුලියාපිටිය විධායක ඉංජිනේරු කාර්‍යාලයෙන් ලබා ගත හැකිය.

ඒ. ඊ. ජේ. ද පින්තු,
විධායක ඉංජිනේරු—කුලියාපිටිය කොට්ඨාශය.

1972 දෙසැම්බර් මස 20 වෙනි දින,
ප්‍රාදේශීය වැඩ කාර්‍යාලය, කුලියාපිටිය.

1–316—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ ප්‍රවාහන අංශයේ ඇති අළුත් මෝටර් රථ අමතර කොටස් මිළදී ඉවත් කරගෙන යාම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජනවාරි 31 දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට හෝ රු. 100 ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 ජනවාරි 31 දින් දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම් ලබාගත හැකිය.

වැඩි විස්තර සඳහා ඉහත ලිපිනයේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් විමසන්න.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි සංවර්ධන කොමසාරිස්
වෙනුවට.

1973.01.02 දින,
කොළඹ 1,
අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව.

1–397—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### මුද්දර කවර සැපයීම

මුද්දර කවර සැපයීම සඳහා 1973 පෙබරවාරි 27 දින පෙ. ව. 10 දක්වා කොළඹ 1, මූලස්ථාන ගොඩනැගිල්ලේ, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරනවිට, ටෙන්ඩර්කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ඇත. 1 වැනි ඡෙදයේ සඳහන් දිනට හා වේලාවට පෝස්ට් මාස්ටර් ජනරාල් කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

3. කොළඹ 1, ප්‍රධාන තැපැල් කාර්යාලයේ, මූලස්ථාන කාර්යාල ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී කාර්යාලයෙන් ඉල්ලුම් කිරීමෙන් 1973 පෙබරවාරි 26 දින ප. ව. 3 දක්වා ලබා ගත හැකි පෝරම මගින් ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර සියල්ල දෙපිටපතකින් තිබිය යුතුය. ටෙන්ඩර බහාලන ලියුම් කවරයේ වම්කොනේ "මුද්දර කවර සැපයීම සඳහා ටෙන්ඩරය" යන්න ලකුණු කළ යුතුය.

5. ටෙන්ඩර, රෙජිස්තර තැපැලෙන් යැවිය යුතුය. මෙරට ටෙන්ඩර් කරුවකු මේ ආකාරයට ටෙන්ඩරය යැවීමට අකමැති වේනම්, ඔහු සිය ටෙන්ඩරය ලියුම් කවරයක බහා එහි මතුපිට ඉහත 4 වැනි ඡේදයේ සඳහන් කරන ලද විස්තර සහ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියා මුද්‍රා තබන ලද එම ටෙන්ඩරය පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ ගේ කාර්යාලයට බාර දී එය බාරගත් බවට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

6. කොළඹ 1, ප්‍රධාන තැපැල් කාර්යාලයේ 17 වැනි කවුන්ටරයේදී රු. 50 ක ටෙන්ඩර් තැන්පතුවක් කළයුතු අතර, ටෙන්ඩර් ආකෘතිපත් ලබාගැනීමට කලින් ඒ පිළිබඳව කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. 1973 පෙබරවාරි 26 දින ප. ව. 3 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කරනු ලැබේ.

7. නියමිත පරිදි සැම්පල් ඉදිරිපත් කළ යුතුය.

8. මෙම දෙපාර්තමේන්තුව, අමුද්‍රව්‍ය සඳහා කිසිම ආනයන බල පත්‍රයක් නිකුත් කිරීමට නිර්දේශ නොකරන හෙයින්, එම ද්‍රව්‍ය ආනයන කිරීම සඳහා ආනයන බලපත්‍ර අවශ්‍ය නොවන එවැනි කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

9. තවදුරටත් විස්තර සහ කොන්දේසි කොළඹ 1, ප්‍ර. තැ. කාර්යාලයේ ගණකාධිකාරී (මුද්දර) වෙත ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

සී. ජේ. සේරසිංහ,
වැඩබලන පෝස්ට්මාස්ටර් ජනරාල් සහ
විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැ. සහ වි. මූලස්ථානය,
කොළඹ 1.

1–396—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

1973 වර්ෂයේ මහොගනී තීරු වගාව සඳහා පහත සඳහන් ප්‍රදේශයන් තුනේ අඩි 33 න් 33 ට අඩි 6 ක් පළල කැලෑ තීරු සුද්දකර එම තීරු මැදින් අඩි 10 න් 10 ට අඩි 3 ක් උසැති අඟල් 3 ක් මහත කුංඩා ගසා දීම සඳහා ගාල්ලේ දකුණු දිසා වන නිලධාරි විසින් 1973 ජනවාරි මස 26 වැනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(1) තවලම වන අඩවියේ කන්නෙලිය වනයේ කොම්පාට් මන්ට් 28 වේ අක්කර ... ... 200 යි

(2) තවලම වන අඩවියේ කන්නෙලිය වනයේ කොම්පාට් මන්ට් 18 වේ අක්කර ... ... 200 යි

(3) අකුරැස්ස වන අඩවියේ දෙදියගල වනයේ කොම්පාට් මන්ට් 13 නේ අක්කර ... ... 300 යි

2. ටෙන්ඩර් ඉල්ලුම් කළ යුත්තේ ගාල්ලේ දකුණු දිසා වන නිලධාරි විසින් නිකුත් කරනු ලබන පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් ආකෘති පත් මගින්ය. 1973 ජනවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ගාල්ලේ දකුණු දිසා වන නිලධාරි කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘතිපත් ලබා ගත හැක. රුපියල් 100 ක් ගාල්ලේ දිසාපති කාර්යාලයෙහි දකුණු දිසා වන නිලධාරි නමින් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට ටෙන්ඩර් ආකෘති පතක් ලබා ගත හැක. එක් එක් ප්‍රදේශයට වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉල්ලුම් කළ යුතුය. මෙම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයක බහා ලේඛන ගත තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් ගාල්ලේ දිසාවන නිලධාරි කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ දැමීමට හෝ පුළුවන. ටෙන්ඩර් බහා එවන ලියුම් කවරයේ වම්පස මුදුනේ "මැහෝගනී ටෙන්ඩර්" යන්න ලොකු අකුරින් සඳහන් කළ යුතුය.

3. 1973 ජනවාරි මස 25 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. එවිට එම ස්ථානයේ ටෙන්ඩර්කරුවන්ට සිටීමට අවසර දෙනු ලැබේ.

4. සාර්ථක ටෙන්ඩර්කරුට දන්වා යවා දින හතක් ඇතුළතදී ගිවිසුමට බැඳී එහි වැඩ පටන් ගත යුතුය. එසේ නොහැකි වුවහොත් ටෙන්ඩර් ආකෘති පත් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. ගිවිසුමට බැඳී මාස දෙකක් ඉකුත්වීමට පෙර පැළ ඉම්තීරු කපා කුංඩා ගසා අවසන් කරදිය යුතුය කිසිම හේතුවක් නිසා මෙම ගිවිසුම්වල කාලය දීර්ඝ කරනු නොලැබේ. වැඩි විස්තර ගාල්ලේ දකුණු දිසා වන නිලධාරි ගෙන් ලබා ගත හැකිය.

ඇම්. පුෂ්පරාජ්,
දකුණු දිසා වන නිලධාරි.

දිසාවන නිලධාරි කාර්යාලය,
ගාල්ල.

1–398—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කොළඹ දකුණ ප්‍රදේශයේ පාසැල්වලට කිරි බිස්කෝතු ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර බාර ගැනීම

මෙහි පහත දැක්වෙන සේවය සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

1. මැලිබන් යා ලංකා බිස්කෝතු සමාගම්වල බිස්කෝතු නිෂ්පාදන ස්ථානවල සිට රාත්තල් 20 පෙට්ටිවල අසුරන ලද බිස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි පිහිටි පාසැල්වලට ප්‍රවාහණය කිරීම :—

(1) මැද කොළඹ
(2) උතුරු කොළඹ
(3) දකුණු කොළඹ
(4) දෙහිවල-ගල්කිස්ස
(5) මොරටුව
(6) කෝට්ටේ
(7) කොලොන්නාව
(8) කොට්ටාව
(9) හෝමාගම
(10) අවිස්සාවේල්ල
(11) කැස්බෑව
(12) බොරැල්ල.

ඉහත සඳහන් මණ්ඩල සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 7, ග්‍රීන්පාත්හි, දකුණු කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 1973 ජනවාරි මස 19 දින පෙරවරු 10.30 තෙක් භාරගනු ලැබේ.

කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි නියමිත ආකෘතිපත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු වේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක් කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත් අයට 1973 ජනවාරි 17 දින දවල් 11.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම්, එකී මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය.

ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂා කරන අයවලුන් විසින් කොළඹ 7, ග්‍රීන්පාත්හි, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රුපියල් 10,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි, 1973 වර්ෂයට ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ගෙන් සහතිකයක් හා මණ්ඩල දෙකකට වැඩි සංඛ්‍යාවකට ටෙන්ඩර් ගාස්තු ඉදිරිපත් කරන්නේ නම්, ඉල්ලුම්කරුගේ නමට ලියාපදිංචි කරන ලද 1973 වර්ෂයේ බලපත්‍ර ලබාගත් ලොරි දෙකක්වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. මූලික අවශ්‍යතාවය ඉහතකී පරිදි ලොරි දෙකක් වන අතර, ප්‍රවාහණය භාරගන්නා මණ්ඩල ගණන අනුවත්, ඒ මණ්ඩලවල ගමනාගමන පහසුකම් අනුවත්, අතිරේකව පාවිච්චි කළ යුතු ලොරි ගණන ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කළ යුතුවේ. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට පෙර, කොළඹ 7, ග්‍රීන්පාත්හි, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් හෝ එකී සමිතියට

මෙම සේවය ඉටු කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ අයට, පෝර්ම නිකුත් කරනු නොලැබේ.

කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇනවුම්පත් ලැබී පාසැල පවත්නා දින 7 ක් ඇතුළත පාසැල්වලට විස්කෝතු ගෙන ගොස් භාර දීම නිම කළයුතු වේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමේ හෝ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය. ටෙන්ඩර් පිළිබඳ සියළුම කොන්දේසි හා වෙනත් විස්තර කොළඹ, ග්‍රීන්පාත්, ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන නිලධාරීගෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු,  
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,  
කොළඹ 7, ග්‍රීන්පාත් හි,  
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

1–319—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### ගබඩා ද්‍රව්‍ය හා භාණ්ඩ වව්නියා, මැදවච්චිය, අනුරාධපුර, ත්‍රිකුණාමලේ සිට එකතුකොට ගෙන පුල්මුඩේ යන්ත්‍රාගාරයට ප්‍රවාහනය කිරීම

ගබඩා ද්‍රව්‍ය හා භාණ්ඩ එකතුකොට ගෙන පුල්මුඩේ යන්ත්‍රාගාරයට ප්‍රවාහනය කිරීම සඳහා 1973.01.20 දින ප. ව. 2 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා සහ කොන්දේසි පුල්මුඩේ ඉල්මනයිට් යන්ත්‍රාගාරයේ යන්ත්‍රාගාර කළමනාකාර තැන වෙතින්, චීන වරායේ වැඩ බලන යන්ත්‍රාගාර කළමනාකාර තැන වෙතින් හෝ, ප්‍රධාන කාර්යාලයේ සැපයීම් නිලධාරි තැන වෙතින් 1973. 01. 19 දින සවස 3 දක්වා, සාමාන්‍ය රාජකාරි වේලාවන් තුල ලබාගත හැක.

එම පත්‍රිකා ලබාගැනීම සඳහා, ආපසු ගෙවන රු. 100 ක මුදලක් සහ ආපසු නොගෙවන රු. 5 ක මුදලක් තැන්පත් කළ යුතුය.

ප්‍රධාන ගණකාධිකාරි,  
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

ඇස්වීපී.  
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය,  
167, ශ්‍රී විපුලසේන මාවත,  
කොළඹ 10.  
18. 12. 72.

1–412—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## යාපනය බන්ධනාගාරයට අයත් හිස් ගෝනි විකිණීම

1. යාපනය බන්ධනාගාර අධිකාරී විසින් හිස් ගෝනි 800 ක් විකිණීම සඳහා 1973. 1. 31 වෙනි දින පෙ. ව. 10. 00 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ

2. ටෙන්ඩර් පත් භාරගනු ලබනුයේ ලාංකිකයන්ගෙන් පමණි.

3. ටෙන්ඩර් පත්‍රය සඳහා රු. 50 ක මුදලක් තැන්පත් කළ යුතු අතර, එම මුදල ඕනෑම මහාලේකම් කාර්යාලයකදී හෝ මෙම කාර්යාලයේදී තැන්පත් කළ හැකිය. ඒ සඳහා නිකුත් කරනු ලබන මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍ර සමඟ අමුණා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත් සිල් තබන ලද ලියුම් කවරයක බහා එහි වම්පස ඉහල කෙළවරේ "හිස් ගෝනි ලබා ගැනීමේ ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් යාපනය, බන්ධනාගාර අධිකාරි යන ලිපිනයට හෝ එම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය හැක.

5. ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්හි මිළ ගණන් අකුරින් හා ඉලක්කමින් සඳහන් විය යුතු අතර, එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් පතේ වෙනස්වීම් හෝ ඇතුලත් කිරීම් වෙතොත් ටෙන්ඩර්කරු විසින් එම ස්ථානය අත්සන් කළ යුතුය.

6. 1973. 1. 31 දින පෙ. ව. 10 ට පහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

7. යම් ටෙන්ඩර් පත්‍රයක් භාර ගත් බවට ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුලතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වී නම් හෝ ඉවත් කර ගැනීමේ කාර්යය පැහැර හැරියේ නම් ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කළ මුදල් රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඇතුළත් කරනු ලැබේ. අන් ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලබනුයේ පිළිගත් ටෙන්ඩර්කරුවන් විසින් උක්ත ද්‍රව්‍ය ඉවත් කර ගැනීමෙන් අනතුරුවයි.

8. සතියේ දිනයන්හි රාජකාරී වේලාවන්හිදී ටෙන්ඩර්කරුවනට හිස් ගෝනි පරීක්ෂා කර බැලිය හැක.

9. වැඩි විස්තර පහත අත්සන් කරනු ලබන අයගෙන් ලබාගත හැක.

කේ. තංගරාජා,  
බන්ධනාගාර අධිකාරී, යාපනය.

72. 12. 20 වෙනි දින,  
යාපනය,  
බන්ධනාගාරයේ දීය.

1–313—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

1973 මුදල් වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍යයන් මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් 1973.1.31 දින පෙ. ව. 10.30 දක්වා මීගමුව බන්ධනාගාර අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.—

(1) පොල් ගෙඩි 450 ක පමණ කුඩු දිනපතා.

(2) මුල්තැන් ගෙයි ඉතුරු වන ඉඳුල් කෑම ද්‍රව්‍යයන්.

2. ටෙන්ඩර් සඳහා රු. 10 ක මුදලක් මෙම කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. එයට ලබාගත් රිසිට් පත ටෙන්ඩර් පත්‍රය සමග අමුණා එවිය යුතුයි. තමාගේ ටෙන්ඩරය භාරගත් ලිපියකින් දන්වනු ලදුව නියමිත මාසික මුදල සෑම මසකම පලමුවෙනි දින ගෙවීමෙන් පසු ඉහත සඳහන් ද්‍රව්‍යයන් දිනපතා ගෙන යාමට අවසරය දෙනු ලැබේ. ටෙන්ඩරය භාරගත් බවට දන්වන ලද ලිපිය ටෙන්ඩර්කරු විසින් දී තිබෙන ලිපිනයට නොලැබුනහොත් හෝ ගෙනවිත් දුනහොත් එය ඔහුට ලැබුන බව සලකනු ලැබේ.

3. ටෙන්ඩර් කරුවන් ඉඳුල් කෑම සහ පොල්කුඩු දිනපතා ගෙන යාම සඳහා මසකට ගෙවීමට කැමති මුදල සඳහන් කලයුතුයි. සීල් තබන ලද ටෙන්ඩරය පහත සඳහන් කරන අයට එවිය යුතුයි. "පොල් කුඩු සහ ඉඳුල් කෑම මිලයට ගැනීම" යනුවෙන් කවරයේ වම් කෙලවරේ සටහන් කල යුතුයි. සීල්තබන ලද ටෙන්ඩරය ඉහත සඳහන් දින පෙ. ව. 10.30 දක්වා මා විසින් භාර ගනු ලැබේ. මේ සඳහා මුද්‍රිත පෝරම නැත.

4. මීගමුව බන්ධනාගාර අධිකාරීතුමාගේ කාර්යාලයේදී 1973 ජනවාරි 31 දින උදේ 10.35 ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටීමට පුළුවන.

5. මේ සඳහා ලබා ගත යුතු තවත් විස්තර පහත සඳහන් අයගෙන් ලබා ගත හැක.

ආර්. ඩී. ඩක්වර්ත්,  
මීගමුව බන්ධනාගාර අධිකාරී,  
මීගමුව.

1–312—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

ලංකා ධීවර සංස්ථාව

ටින් මාළු ලේබල් මුද්‍රණය කර සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ඉහත සඳහන් සේවය සඳහා ලංකා ධීවර සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 22. 1. 73 දින ප. ව. 2.30 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

රු. 50 ක ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු පහත අත්සන් තබන අයගෙන් 1973. 01. 20 වැනි දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

කළමනාකාර, සැපයීම් සහ ගබඩා.

රොක් හවුස් පටුමග,
කොළඹ 15.

1–418—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1973 කෑම ද්‍රව්‍ය සැපයීමට ටෙන්ඩර් කැඳවීම

1973 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ආයතනවලට කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් ('' ලාංකික '' යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියන් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ. කෑම ද්‍රව්‍ය සැපයිය යුතු කාලසීමාව 73.12.31 දක්වා හෝ එයට පෙර කඳවුරු වැසුවොත් එම දිනය දක්වාය.

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| මහියංගනය පුනරුත්ථාපන කඳවුර ... ... ... ... ... | 50 0 ... | 1,000 ... | 25.1.1973 |
| රිදියගම පුනරුත්ථාපන කඳවුර ... ... ... ... ... | 50 0 ... | 1,000 ... | 25.1.1973 |

ආහාර සඳහා ගණන් ඉදිරිපත් කිරීමේදී බත්, පාන්, තේ, සීනි, පරිප්පු, සුදුරු සහ කොත්තමල්ලි යන ද්‍රව්‍යයන් ඇතුලත් නොකොට ගණන් ඉදිරිපත් කළ යුතු බව හා (සියලුම ආයතනයන් සම්බන්ධයෙන් බත්, පාන්, තේ, සීනි, පරිප්පු, සුදුරු සහ කොත්තමල්ලි ආදි ද්‍රව්‍යයන් අත්හැරීමෙන් ආහාර මිශ්‍රණයේ වෙනස් කම් ඇතිකර ඇති බව ද, ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් දැනගත යුතුව ඇත.) රිදියගම බන්ධනාගාරය සම්බන්ධයෙන් මාලු ද අත්හැර ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. එක් ආයතනයක් සඳහා සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා '' සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 9 '' කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිත යකු විසින් හෝ කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ජේ. පී. දෙල්ගොඩ මහතාට භාරදී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ '' ......'ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය '' කියා ලියා මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට ලැබෙන සේ එවිය යුතුයි. මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ 9, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්යාල යේදී (බන්ධනාගාර මූලස්ථානය) ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට (ඉහත 1 වැනි ඡෙදය බලන්න) පෙර දින ප.ව. 2.00 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යන තුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තව ද, කොන්ත්‍රාත් කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලින් රු. 3,000 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම කොන්ත්‍රාත්කරුවන්ට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ නො එසේව එහි ගෙන ගොස් භාර දුනහොත් එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුනු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛන සඳහා තැන්පත් කරනු ලබන මුදල් වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරනු ලබන ගණන් ඉලක්කමින් මෙන් ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන්, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට, ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට අවශ්‍ය තරම් ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කිරීමට අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරය. ඒ ඒ බන්ධනාගාර අධිකාරි තැනගෙන් කොන්ත්‍රාත්තුව හරියාකාර කිරීමට වුවමනා කරන සියලු තොරතුරු දැනගත හැකිය.

13. ඒ ඒ ටෙන්ඩරය සඳහා වන සියලු කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නොලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීම හෝ බද්ද වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවෙකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ බලය යම් පුද්ගලයෙකු වෙත පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන කරම් කරුණු ඇත්නම් කිසියම් පුද්ගලයකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවීම ගැන තම විරුද්ධත්වය ලියා දැනුම් දිය හැක. එවැනි කිසිම පුද්ගලයකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථමයෙන් රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරනලද වාර්තාවක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් හා දේපොළවල ප්‍රමාණය හා වටිනාකම එහි සඳහන් කළ යුතුයි.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එසේ සේවය ඉටු කරන ලද්දේ, ටෙන්ඩර් කැඳවන දිස්ත්‍රික්කයේ හෝ කොට්ඨාශයේ හෝ සඳහා නොවේ නම්, තමන් විසින් එසේ කොන්ත්‍රාත්තුව ඉටු කරන ලද පළාත් හෝ දිස්ත්‍රික්ක සඳහන් කළ යුතුයි.

(ඇ) වෙන දෙපාර්තමේන්තුවකට කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එම දෙපාර්තමේන්තුවේ නම සහ තමා සේවය කළේ කුමන දිස්ත්‍රික්කයේ ද යන වග සඳහන් කරමින් ඒ බවට එම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිළධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද, ඔහුට පසුව එම පදවිය දරන්නා වූ නිළධාරියාද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථානයෙන් ලබා ගත හැක.

ජී. ඒ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය,
1973.1.2.

1–315—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එෆ් 1 විකිණීම් ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1973 ජනවාරි මස 23 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජනවාරි මස 22 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂාකර බැලීමට පිළිවන.

ඉල්ලීම් අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් 50%ක මුදලක් තැන්පත් කළ යුතුය.

වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගිය හොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

වෙන්දේසි පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින ගැසට් පත්‍රය බලන්න.

පී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඞී/විකිණීම්/90
1973 ජනවාරි 2 දින,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ දීය.

(1) "ගුඞ් ඉයර්" ටයර් (40×8) 4 යි
(2) දුනු පට්ටම් 17 යි
(3) යකඩ කම්බි කොයිල් 12 යි
(4) ඇඹරුම් ගල් 3 යි
(5) රෝද සමග "ඩන්ලොප්" ටයර් (11.00×20) 1 යි
(6) දන්තාලේප හිස් බඳුන් කාටුන් 2 යි
(7) යන්ත්‍ර කොටස් 6 යි
(8) යන්ත්‍ර කොටස් 3 යි
(9) ගාන්චු ("සී" බකල්ස්) ග්‍රොස් 60 යි
(10) ආයුර්වේද බෙහෙත් මලු 1 යි
(11) බොටින් ඉන්ටර්නැෂනල් බිස්නස් රෙජිස්ටර් 10 යි
(12) තාප සහ භාණ්ඩ ("රිපැක්ටරි වෙයා") කැබලි 1 යි
(13) වයර් හීල්ඩ්ස් 48 යි
(14) ස්ටීල් ඩ්‍රොපර්ස් පෙට්ටි 27 යි
(15) "ඩන්ලොප්" ටියුබ් 6.00×12 7 යි
"ගුඩ් ඉයර්" ටියුබ් 6.00×13 1 යි
"ගුඩ් ඉයර්" ටියුබ් 4.00×19 3 යි
(16) යන්ත්‍ර කොටස් 1 යි
(17) රබර් පැකින් රින්ග්ස් 48 යි
(18) මැග්නොට්‍රොල් ලික්විඩ් ලෙවල් කන්ට්රෝල් වැල්ස් 2 යි
(19) රබර් පැකින් රින්ග්ස් 205 යි
(20) ස්ටීල් ඩ්‍රොප්ස් මලු 2 යි
(21) රබර් රින්ග්ස් මිටි 3 යි
(22) ට්‍රැක්ටර් අමතර කොටස් අඩංගු ලී පෙට්ටි 1 යි
(23) යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි
(24) ඔයිල් පිල්ටර් එලිමන්ට් 50 යි
(25) චේන් බ්ලොක් 1 යි
(26) රෙදි නූල් (නොයෙකුත් ප්‍රමාණවල පන්ඩු) 494 යි
(30) "සෝලෙක්ස්" ප්fලෝට් ටයිප් කාබරේටර් 6 යි
(31) 1. පාවිච්චිකළ පොටෝ ඇල්බම් 2 යි
2. ටැලිපෝන් නාමාවලි 3 යි
3. පාවිච්චිකළ ඇඳුම් 4 යි
4. පොත් 4 යි
5. නෙක් බෙල්ට් 1 යි
6. පාවිච්චිකළ සපත්තු ජෝඩු 1 යි
7. කුඩා මත්පැන් බෝතල 4 යි
8. ආප්ටර් ෂේව් ලෝෂන් ටින් 1 යි
9. "අකායි" හෙඩ් ක්ලීනර් පෙට්ටි 1 යි
10. ක්වැකර් ඕට් ටින් 1 යි
11. පරයින් පැන් 1 යි
(32) රසායන ද්‍රව්‍ය කාටුන් 1 යි
(33) වීදුරු සැම්පල් කැබලි පෙට්ටි 1 යි
(34) ෂ්වේඩ් හම් කැබලි 2 යි
(35) ශීතකරන (ජී. ඊ. සී. ඩබල් ජ්‍රීස්) පෙට්ටි 1 යි
(37) "ගුඩ් ඉයර්" ටයර් 7.00—14 2 යි
(38) කාබන් ටේට්‍රාක්ලෝරයිඩ් සහ පොටෑසියම් හයිඩ්‍රොක්සයිඩ් පෙට්ටි 2 යි
(39) "ජෙකොටයිට්" කිරිපොවන බෝතල පුඩු සහිත 120 යි
"ජෙකොටයිට්" කිරිපොවන බෝතල පුඩු රහිත 18 යි
(40) වීදුරු තඹලේරු දුසිම් 12 යි
(41) "එස්. අයි. එෆ්." වෙල්ඩින් රොඩ්
පැකට් 8 ක් සහ "ඉන්ටර්ලස්" ඉලෙක්ට්‍රෝඩ් හෝල්ඩර් 24ක්
"පොරොලොයිඩ්" ඉලෙක්ට්‍රෝඩ් පැකට් 3 යි
ප්‍රොටෙක්ටිව් මාස්ක් පැකට් 1 යි
(42) ඩ්‍රිල් බිට්ස් 8 යි
(43) "යේල්" එස් 101 කැබිනට් අගුළු පෙට්ටි 5 යි
(44) සපත්තු නූල් අඩි. 3 බෝල පැකට් 14 යි. අඩි. 1 බෝල පැකට් 30 යි
(46) මෝටර් රථ අමතර කොටස් 10 යි
(48) කෘතිම නූල් කෝන් 20 යි
(49) හිස් බෝතල කාටුන් 33 යි
(51) ඉන්වොයිස් පොත් පැකට් 12 යි
(52) ගුදිරිය සමග ස්ප්‍රින් ඇඳන් 1 යි

(53) මැදීමට ගන්නා කුඩු-පිත් 26 යි
(54) ඇඳ ඇතිරිලි 8 යි
(55) මුද්‍රිත පොත් 338 යි
(56) රසායන ද්‍රව්‍ය බෝතල 26 යි
(57) මැදීමට ගන්නා භාණ්ඩ පැකට් 6 ක් සහ කෑබලි 14 ක්
(58) වෝල්ටයිල්ස් පෙට්ටි 6 යි
ඉන්සියුලේටඩ් ඉලෙක්ට්‍රික් කේබල් යාර 500 යි
රබර් රින්ග්ස් 24 යි
(59) පිත්තල බෝල 4 යි
(60) ටයර් (කුඩා 4 ක් සහ ලොකු 9 ක්) 13 යි
(61) යන්ත්‍ර කොටස් 33 යි
(62) පට්ටම් යකඩ මිටි 12 යි
(63) පියුස් බෝඩ් 3 යි
(64) "වින්ක්වර් සින්ජිබිරිස් මිට්ස්" (සුරාබද්ධ බලපත්‍ර ඇති අයට පමණයි) බෝතල 94 යි
(65) ඊයම් තහඩු 5 යි
(66) යන්ත්‍ර කොටස් 2 යි
(67) රෝද සමග ටයර් (4.00×19) 1 යි
(68) හයිඩ්‍රොලික් බ්‍රේක් ප්ලුයිඩ් බෝතල 15 යි පින්ට් 1 යි
(69) කුඩා කන්නාඩි පෙට්ටි 12 යි
(70) ඇලිබන් විස්කෝතු ඔතන කඩදාසි රීල් 6 යි
(73) රවුම් යකඩ කොයිල් 1 යි.

1-394—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

**කැලෑ දෙපාර්තමේන්තුව—දැව වෙන්දේසියේ විකිණීම**

කල්මුනේ අඩවියේ නොයෙක් ස්ථානවල ඇති වන අපරාධවල අත් අඩංගුවට ගත් මිල්ල, හල්මිල්ල, බුරුත, පාමාන්කා, හෙලම්බෙ යන වර්ගයෙන් දැව තොග නැගෙනහිර දිසා වන නිලධාරීන් විසින් කල්මුනේ අඩවි වන නිලධාරි කාර්යාලයේදී 1973. 1. 22 වැනි දින පෙ. ව. 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන් දැව වෙන්දේසි කිරීමට පෙර එම ස්ථානවල ඇති දැව පරීක්ෂා කර බලා සෑහීමකට පත්විය යුතුයි.

වැඩි විස්තර සඳහා කල්මුනේ අඩවි වන නිලධාරි ගෙන් විමසන්න.

ඩබ්. ජේ. ජේ. මේදර්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

දිසා වන කාර්යාලයේ දීය,
මඩකලපුව. 1972. 12. 6 දින.

1-408—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

**රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව**

ලොරි, වෑන් සහ කාර් ආදී රථවාහන 25 ක් පමණ 1973 ජනවාරි මස 23 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 ට කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වාහන ඉහත සඳහන් ස්ථානයේදී කාර්යාල වේලාවන්හිදී පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ සැපයීම් අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ.
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

1-474—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

බලපිටියේ වැලිවතුගොඩ පදිංචි වනිගමුනි ජේව් මැන්දිස් වන මම අද සිට මාසයක් ඉකුත්වූ පසු (කෑගලු අධිකරණ කොට්ඨාශය තුල යයි මීට පෙර ලියවිලි වල සඳහන් කර ඇතත් එය අවලංගු කර) ගාලු දිස්ත්‍රික්කයේ බලපිටිය අධිකරණ කොට්ඨාශය තුල සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුලත් කර ගන්නාමෙන් රෙජිස්ටාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව (107 අධිකාරය වන) නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

මෙයට,
ව. ජේ. මැන්දිස්.

වැලිවතුගොඩ,
බලපිටිය.
1973. 1. 1.

1-416—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

**දැන්වීමයි**

කහවේ උඩුවරගොඩ පදිංචි දේව ඩයිවින් ද සිල්වා වන මම මෙදින සිට මාසයක් ගතවූ පසු ගාළු දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම පිණිස නොතාරිස් වරුන්ගේ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රිජිස්ට්‍රාර් ජෙනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥා පනතේ 7 වෙනි වගන්තිය යටතේ 1 වෙනි උප ලේඛණයේ "ආ" කොටසේ දෙවෙනි ව්‍යවස්ථාව අනුව මෙයින් දැනුම් දෙමි.

මෙයට,
ඩී. ඩී. ද සිල්වා.

උඩුවරගොඩදීය,
1973. 1. 2 දින දීය.

1-420—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

**දැන්වීමයි**

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

**සැපයුම්කරුවන් ලියා පදිංචි කිරීම**

පහත සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා මෙම සංයුක්ත මණ්ඩලයේ ලියාපදිංචි වීමට කැමති ලාංකික සැපයුම්කරුවන් ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත නම් සඳහන් අය වෙත 1973 ජනවාරි මස 25 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය:—

(1) ලිපි ද්‍රව්‍යය
(2) මුද්‍රණය කිරීම
(3) ගෘහ භාණ්ඩ
(4) කාර්යාලීය උපකරණ
(5) යකඩ බඩු
(6) පයිප්ප සහ උපකරණ
(7) ලී
(8) තීන්ත, වාර්නිස් හා විෂබීජ නාශක ද්‍රව්‍යයන්
(9) බොරළු, වැලි, ගඩොල් සහ අනෙකුත් ගොඩනැගිලි උපකරණ
(10) සනීපාරක්ෂක හා ගෘහ උපකරණ
(11) විදුලි උපකරණ හා ද්‍රව්‍ය
(12) විදුලි භාණ්ඩ සේවා හා සැපයුම
(13) රසායනාගාර ද්‍රව්‍ය සහ උපකරණ
(14) රබර් පටි
(15) ටයර් සහ ටියුබ්
(16) මැනිලා සහ නයිලෝන් කඹ
(17) මෝටර් උපකරණ
(18) වැහි කබා
(19) යකඩ/වානෙන් තැනීම, වාත්තු වැඩ හා ලියවන පට්ටල් වැඩ

(20) ප්‍රථමාධාර
(21) කැනීමේ යන්ත්‍ර සහ අමතර කොටස්
(22) ද්‍රව්‍යභාණ්ඩ
(23) බෙහෙත් වර්ග හා ශල්‍ය උපකරණ
(24) ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සහ සායම් කිරීම
(25) රෙදි වැරහැලි

ඉහත සඳහන් ද්‍රව්‍ය එකකට වැඩි සංඛ්‍යාවකට ලියාපදිංචි වීමට කැමති ඉල්ලුම් කරුවන් ඒ ඒ ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් පත්‍ර එවිය යුතුය. එසේ නොකළහොත් ඔවුන් ලියාපදිංචි කරනු ලබන්නේ ඉල්ලුම් පත්‍රයේ මුලින් සඳහන් ද්‍රව්‍ය සඳහා පමණි.

සාමාන්‍ය වශයෙන් මිලගණන් කැඳවනු ලබන්නේ ලියාපදිංචි කළ සැපයුම් කරුවන්ගෙන් පමණක් වුවත් අනෙක් සැපයුම්කරුවන්ගෙන් වුවද මිලගණන් කැඳවීමේ අයිතිය ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය වෙත රැඳී තිබේ.

කලින් කල මිලගණන් දැන්වීමට අපොහොසත් හෝ මිලගණන් දැන්වීමෙන් පසු නිසියාකාර සැපයීමට අපොහොසත් සැපයුම්කරුවන්ගේ නම් කිසිම දැන්වීමක් නොකර ලේඛණයෙන් කපා හරිනු ඇත.

ප්‍රධාන ගණකාධිකාරී.

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය,
167, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.
1972. 12. 15.

1–403—73.01.12 දින අංක 42 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 | සිකුරාද ... | 72.12.27 | බදාද | දවල් | 12.00 |
| | 73. 1.12 | සිකුරාද ... | 73. 1. 3 | බදාද | දවල් | 12.00 |
| | 73. 1.19 | සිකුරාද ... | 73. 1.10 | බදාද | දවල් | 12.00 |
| | 73. 1.26 | සිකුරාද ... | 73. 1.17 | බදාද | දවල් | 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 | සිකුරාද ... | 73 .1.24 | බදාද | දවල් | 12.00 |
| | 73. 2. 9 | සිකුරාද ... | 73. 1.31 | බදාද | දවල් | 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්ද ... | 73. 2. 7 | බදාද | දවල් | 12.00 |
| | 73. 2.23 | සිකුරාද ... | 73 .2.14 | බදාද | දවල් | 12.00 |
| මාර්තු | 73. 3. 2 | සිකුරාද ... | 73 .2.21 | බදාද | දවල් | 12.00 |
| | 73. 3. 9 | සිකුරාද ... | 73. 2.28 | බදාද | දවල් | 12.00 |
| | 73. 3.16 | සිකුරාද ... | 73. 3. 7 | බදාද | දවල් | 12.00 |
| | 73. 3.23 | සිකුරාද ... | 73. 3.14 | බදාද | දවල් | 12.00 |
| | 73. 3.30 | සිකුරාද ... | 73. 3.21 | බදාද | දවල් | 12.00 |
| අප්‍රේල් | 73. 4. 6 | සිකුරාද ... | 73 .3.28 | බදාද | දවල් | 12.00 |
| | 73. 4.11 | බදාද ... | 73. 4. 4 | බදාද | දවල් | 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්ද ... | 73. 4.11 | බදාද | දවල් | 12.00 |
| | 73. 4.27 | සිකුරාද ... | 73. 4.18 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.